# විගණන සේවා කොමිෂන් සභාව

## කාර්ය සාධන වාර්තාව

## 2017.10.01-2017.12.31

විගණන සේවා කොමිෂන් සභාව

අංක 35 ඒ

ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත

කොළඹ 08

## දැක්ම

මහජන බැඳියාව සහ වගවීම සඳහා කැප වූ

විශිෂ්ට විගණන සේවයක්

## මෙහෙවර

වෘත්තීයමයභාවය, නිපුණත්වය සහ යහපාලනය පෙරදැරි කර ගත් රාජ්‍ය විගණන සේවයක් ස්ථාපනය කිරීම තුළින් රාජ්‍ය සම්පත් වලට වගවීම සහතික කිරීම

## අපගේ අගයන්

- ස්වාධීනත්වය
- අපක්ෂපාතීත්වය
- අවංක භාවය
- නවෝත්පාදනය
- පාරදෘශ්‍යභාවය
- වගවීම
- වෘත්තීය නිපුණත්වය

# පෙලගැස්ම



| අනු අංකය | කාරණය | පිටුව |
|---|---|---|
| **1.** | හැඳින්වීම | **1** |
| **2.** | විගණන සේවා කොමිෂන් සභාවේ 2017.10.01 සිට 2017.12.31 දක්වා කාර්ය සාධනය | **1-2** |
| 2.1 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ ව්‍යවස්ථාවේ පැවරී ඇති බලතල හා කර්තව්‍යයන්හි ප්‍රගතිය | 1 |
| 2.2 | මූල්‍ය ප්‍රගතිය | 2 |
| **3.** | කාර්ය මණ්ඩලය | **3-4** |
| 3.1 | කාර්ය මණ්ඩල පුහුණුව | 4 |
| **4.** | කොමිෂන් සභා රැස්වීම් | **4** |
| **5.** | ඇමුණුම් | |
| | 1. 2017.01.01 සිට 2017.12.31 දක්වා මූල්‍ය වාර්තාව | 5 |
| | 2. විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන | 6 |

# විගණන සේවා කොමිෂන් සභාව

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII වන පරිච්ඡේදයේ 153 අ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ සේවයට බඳවා ගැනීමේ පටිපාටි, පත් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහකිරීම්වලට අදාළ රීති සකස් කිරීම,නීතිය මඟින් ස්ථාපිත ජාතික විගණන සේවයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම සහ නීතිය මඟින් සලකනු ලබන පරිදි වූ වෙනත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමේ බලයද කොමිෂන් සභාවට පැවරී ඇත.

## 2. විගණන සේවා කොමිෂන් සභාවේ 2017.10.01 සිට 2017.12.31 දක්වා කාර්ය සාධනය

### 2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ ව්‍යවස්ථාවේ පැවරී ඇති බලතල හා කර්තව්‍යන්හි ප්‍රගතිය


| බලතල | ප්‍රගතිය |
|---|---|
| ශ්‍රී ලංකාරාජ්‍ය විගණන සේවයේ සාමාජිකයින්ගේ පත්කිරීම්, උසස් කිරිම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම. | ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කර නොමැති බැවින් මෙම කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී ඇත. |
| ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ සේවයට බඳවා ගැනීම් පටිපාටි, පත්කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමට අදාල රීති සකස් කිරීම. | ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත වූ පසු ක්‍රියාත්මක කිරීම සඳහා පත්කිරීම්, උසස් කිරිම් හා ස්ථාන මාරු කිරීම් වලට අදාල කාර්ය පටිපාටික රීති දැනටමත් කෙටුම්පත් කර ඇත. |
| ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම. | ජාතික විගණන කාර්යාලය ස්ථාපිත කිරීමට අදාල විධි විධාන ඇතුලත් ජාතික විගණන පනත මෙතෙක් සම්මත වී නොමැති බැවින් අදාල කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී ඇත. |


## 2.2 මූල්‍ය ප්‍රගතිය


2017 වර්ෂය වෙනුවෙන් විගණන සේවා කොමිෂන් සභාව සඳහා පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් 2017.10.01 සිට 2017.12.31 දක්වා වූ කාර්තුව සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් 6,759,454 ක් හා ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් 715,562 ක් වැය කර ඇත.

**මූල්‍ය ප්‍රගති සාරාංශය - 2017.01.01 සිට 2017.12.31 දක්වා**

| | ප්‍රතිපාදන රු. (2017 වර්ෂය) | මුළු වියදම (2017.01.01-2017.12.31) රු. | ඉතිරිය (2017.12.31 දින වන විට) රු. |
|---|---|---|---|
| පුනරාවර්තන | 52,234,000 | 27,397,518 | 24,836,482 |
| ප්‍රාග්ධන | 2,800,000 | 1,092,552 | 1,707,448 |
| **එකතුව** | **55,034,000** | **28,490,070** | **26,543,930** |




2017.01.01 සිට 2017.12.31දක්වා වූ සම්පූර්ණ මූල්‍ය වාර්තාව ඇමුණුම 01 හි දක්වා ඇත.

### 3. කාර්ය මණ්ඩලය

විගණන සේවා කොමිෂන් සභාව සඳහා අනුමත කර ඇති මුළු තනතුරු සංඛ්‍යාව 43කි. එහෙත් ජාතික විගණන පනත මෙතෙක් සම්මත වී නොමැති බැවින් එදිනෙදා පරිපාලන හා මූල්‍ය කටයුතු සඳහා නිලධාරින් 21 දෙනෙකු පමණක් අනුයුක්ත කිරීමට කටයුතු කරන ලදී.

**විගණන සේවා කොමිෂන් සභාවේ අනුමත හා දැනට සේවයේ නියුතුකාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු පිළිබඳ තොරතුරු -2017.12.31 දිනට**

| තනතුරේ ස්වභාවය | තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | ලේකම්<br>අතිරේක ලේකම්<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>අධ්‍යක්ෂ<br>සහකාර ලේකම්<br>සහකාර අධ්‍යක්ෂ<br>විගණන අධිකාරි<br>ගණකාධිකාරි<br>නීති නිලධාරි | 10 | 02 | 08 |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරි<br>භාෂා පරිවර්තක<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 05 | 02 | 03 |
| ද්විතීය මට්ටම | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර<br>රාජ්‍ය කළමනාකරණ සහකාර | 16 | 07 | 09 |
| ප්‍රාථමික මට්ටම | රියදුරු<br>කාර්යාල කාර්ය සහයක | 12 | 10 | 02 |
| එකතුව | | **43** | **21** | **22** |

විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන ඇමුණුම 02 හි දක්වා ඇත.

### 3.1 කාර්ය මණ්ඩල පුහුණුව

විගණන සේවා කොමිෂන් සභා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් වැඩසටහන් යටතේ 2017 සිව්වන කාර්තුව තුල නිලධාරින් පහත දැක්වෙන පරිදි පුහුණු සඳහා යොමු කර ඇත.

| | පුහුණු වැඩසටහනේ නම | තනතුර | නිලධාරින් ගණන |
|---|---|---|---|
| 1 | කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | පරිපාලන නිලධාරි | 01 |
| 2 | ආතති කළමනාකරණය | කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරින් | 21 |

### 04.කොමිෂන් සභා රැස්වීම්


2017.10.01 – 2017.12.31 දින දක්වා කාලය තුල විගණන සේවා කොමිෂන් සභා රැස්වීම් වාර තුනක් (03) ක් පවත්වා ඇත.

ජාතික විගණන පනත සම්මත වී ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කර නොමැති වීම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපේක්ෂිත පරිදි කාර්ය භාරයක් ඉටුකිරීමට කොමිෂන් සභාවට නොහැකි වී ඇත.

ඇමුණුම 01

| විගණන සේවා කොමිෂන් සභාව<br>මුළු ප්‍රතිපාදන සහ වියදම 2017 -01 -01 දින සිට 2017-12-31 දින දක්වා | | | | | | |
|---|---|---|---|---|---|---|
| වැය විෂය | විස්තරය | වාර්ෂික ප්‍රතිපාදන වෙන් කිරීම - 2017 රු. | අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම - 2017 රු. | මු.රෙ. 66 මාරු කිරීම 2017 රු. | වියදම2017-10-01 සිට 2017-12-31 දක්වා රු. | වියදම 2017-01-01 සිට 2017-12-31 දක්වා රු. |
| **23-01-01** | ***පුනරාවර්තන වියදම්*** | **52,234,000.00** | **-** | **-** | **6,759,453.92** | **27,397,518.44** |
| | **පුද්ගල පඩි නඩි** | **27,000,000.00** | | | **3,695,542.83** | **14,398,806.95** |
| 1001 | වැටුප් හා වේතන | 18,000,000.00 | | (200,000.00) | 1,648,720.54 | 6,182,074.88 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,000,000.00 | | | 35,008.35 | 127,610.42 |
| 1003 | වෙනත් දීමනා | 8,000,000.00 | | 200,000.00 | 2,011,813.94 | 8,089,121.65 |
| | **ගමන් වියදම්** | **1,100,000.00** | | | **200.00** | **200.00** |
| 1101 | දේශීය | 100,000.00 | | | 200.00 | 200.00 |
| 1102 | විදේශීය | 1,000,000.00 | | | - | - |
| | **සැපයුම්** | **2,700,000.00** | | | **221,911.55** | **1,393,968.05** |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය වියදම් | 1,500,000.00 | | | 81,958.00 | 943,259.25 |
| 1202 | ඉන්ධන සැපයීම් | 1,000,000.00 | | | 93,347.00 | 308,744.00 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 200,000.00 | | | 46,606.55 | 141,964.80 |
| | **නඩත්තු වියදම්** | **1,550,000.00** | | | **(1,050.00)** | **277,612.55** |
| 1301 | වාහන නඩත්තු වියදම් | 1,000,000.00 | | | (1,050.00) | 277,612.55 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 350,000.00 | | | - | - |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු වියදම් | 200,000.00 | | | - | - |
| | **සේවා** | **19,000,000.00** | | | **2,751,392.58** | **10,953,869.57** |
| 1401 | ප්‍රවාහන වියදම් | 3,000,000.00 | | | 302,933.67 | 1,202,933.67 |
| 1402 | තැපැල් හා සංනිවේදන වියදම් | 1,500,000.00 | | | 186,924.66 | 744,803.69 |
| 1403 | විදුලිය හා ජල වියදම් | 1,000,000.00 | | | 86,667.40 | 318,297.25 |
| 1404 | බදු කුලී හා දේශීය බදු | 10,500,000.00 | | | 1,687,500.00 | 6,750,000.00 |
| 1409 | වෙනත් වියදම් | 3,000,000.00 | | | 487,366.85 | 1,937,834.96 |
| | **මාරු කිරීම්** | **884,000.00** | | | **91,456.96** | **373,061.32** |
| 1505 | සම්මාදම් සහ දායක මුදල් | 200,000.00 | | | - | - |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 684,000.00 | | | 91,456.96 | 373,061.32 |
| **23-01-01** | ***ප්‍රාග්ධන වියදම්*** | **2,800,000.00** | **-** | **-** | **715,561.93** | **1,092,552.36** |
| | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්** | **1,300,000.00** | | | **13,662.00** | **18,162.00** |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000.00 | | | 13,662.00 | 18,162.00 |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300,000.00 | | | - | - |
| 2003 | වාහන | 500,000.00 | | | - | - |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **1,000,000.00** | | | **586,811.93** | **773,640.36** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 1,000,000.00 | | | 586,811.93 | 773,640.36 |
| | **මානව සම්පත් සංවර්ධනය** | **500,000.00** | | | **128,750.00** | **300,750.00** |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 500,000.00 | | | 128,750.00 | 300,750.00 |
| | **මුළු එකතුව** | **55,034,000.00** | **-** | **-** | **7,475,015.85** | **28,490,070.80** |

ඇමුණුම 02


විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන
කොමිෂන් සභාව
ලේකම්
අතිරේක ලේකම්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යක්ෂ
සහකාර ලේකම්
සහකාර ලේකම්
ගණකාධිකාරී
නීති නිලධාරී
සහකාර අධ්‍යක්ෂ
විගණන අධිකාරී
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
අනෙකුත් කාර්ය මණ්ඩලය (කාර්යාල කාර්ය සහායක/රියදුරු)